# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

# 2013

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
முதியோர்களுக்கான தேசிய சபை
NATIONAL COUNCIL FOR ELDERS

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

**முதியோர்களுக்கான தேசிய சபை**

National Council for Elders

**සමාජ සේවා අමාත්‍යාංශය**

**சமூக சேவைகள் அமைச்சு**

Ministry of Social Services

# පටුන


පටුන ....1
පූර්විකාව ....2
විධායක වාර්තාව ....3
හැඳින්වීම ....4
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ....5
  දැක්ම ....5
  මෙහෙවර ....5
සංවිධාන සැලැස්ම ....6
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2013 ....7
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2013 ....8
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2013 ....9
2013 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය ....11
  වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම. ....11
  වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන් - 2013 ....12
  වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2013 ....13
  රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2013 ....14
  දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම - 2013 ....15
  විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම - 2013 ....15
  ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන ....16
  වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ....17
  කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු ....20
  ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ....21
  වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය ....22
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති ....24
2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව ....25
ආදායම් සහ වියදම් වාර්තාව ....26
අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය ....27
උප ලේඛන ....28
විගණකාධිපතිගේ මතය ....31
විගණකාධිපති වාර්තාව ....32
විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු ....44

# පූර්විකාව

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමාජ සේවා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ උන්නතිය උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය තීරණ උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව සකස් කරයි.

2013 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2013 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාවේ අරමුණයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව 2013 වර්ෂයේදී වැඩිහිටි ආත්මාභිමානය, ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණය ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර වඩාත් ඵලදායී සේවාවක් ඉටු කිරීමට ලැබීමද වාසනාවකි.

තවද මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළින් ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම උදෙසා අතීත උරුමයේ කොටස්කරුවන් වූ වැඩිහිටියන් අතරින් අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් දහසක ප්‍රධානයක් ලබා දෙමින් තෘප්තිමත් වැඩිහිටිවියක් උදෙසා කැපවීම සතුටට කරුණකි.

# විධායක වාර්තාව

2013 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය උදෙසා කැපවී ක්‍රියා කළ අතර ඒ නිසාම 2013 වසරේ සැලසුම් කළ පරිදිම සාර්ථක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වැඩසටහන් අතර මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දහසක ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර අභියෝග ජය ගැනීමට ගරු සමාජ සේවා අමාත්‍යතුමාගේත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් මඟ පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යයමණ්ඩල මේ පිළිබඳව දක්වන උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය ද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තුතිය හිමි විය යුතුය.

# හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදුවූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 12.2% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 22% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුභසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි. 2013 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව බලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


## දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායී වැඩිහිටි දිවියක් උදාකිරීම


## මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්මපරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

# සංවිධාන සැලැස්ම


වැඩිහිටි තැනැත්තන් සඳහා
වූ ජාතික සභාව
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
අධ්‍යක්ෂ
(1)
සහකාර අධ්‍යක්ෂ
(සංවර්ධන) (1)
සහකාර අධ්‍යක්ෂ
(පරිපාලන) (1)
නීති නිලධාරී (1)
ගණකාධිකාරී (1)
පරිපාලන නිලධාරී (1)
වැඩිහිටි හිමිකම්
ප්‍රවර්ධන සහකාර - 98
වැඩිහිටි හිමිකම්
ප්‍රවර්ධන සහකාර - 2
කළමනාකරණ
සහකාර (1)
කළමනාකරණ
සහකාර (2)
කළමනාකරණ
සහකාර (1)
කළමනාකරණ
සහකාර (2)
රියදුරු (2)
කා.කා.ස (1)
කා.කා.ස (1)
කා.කා.ස (1)

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2013




| නම | තනතුර |
|---|---|
| 1. ඉමෙල්ඩා සුකුමාර් මිය | සභාපති |
| 2. එන්. කේ. අබේරත්න මිය | උප සභාපති |
| 3. පී. කේ. එස්. සුභෝදිනී මෙය | ලේකම් |
| 4. අනූෂා ගෝකුළ ප්‍රනාන්දු මිය | කමිටු සාමාජික |
| 5. වී. ජෙගරාජසිංගම් මිය | කමිටු සාමාජික |
| 6. ධර්මසිරි පීරිස් මයා | කමිටු සාමාජික |
| 7. ගරු එස්. එස්. විජේරත්න මයා | කමිටු සාමාජික |
| 8. වෛද්‍ය අනිල් දිසානායක මයා | කමිටු සාමාජික |
| 9. ඩබ්ලිව්. බී. කන්නන්ගර මයා | කමිටු සාමාජික |
| 10. තිලක් ද සොයිසා මයා | කමිටු සාමාජික |
| 11. ගීතා විමලවීර මෙය | කමිටු සාමාජික |
| 12. පී. බණ්ඩාරනායක මයා | කමිටු සාමාජික |
| 13. පී. ඩබ්ලිව්. තිලකරත්න බණ්ඩා මයා | කමිටු සාමාජික |
| 14. ඒ ඇබ්ඩෝන් සිල්වා මයා | කමිටු සාමාජික |
| 15. කේ. ඒ. ගුණදාස පෙරේරා මයා | කමිටු සාමාජික |
| 16. පී. එච්. සිරිපාල මයා | කමිටු සාමාජික |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2013

ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන විවිධ සමාජ ආර්ථික ගැටළු හා ප්‍රශ්න අතර මෙරට වැඩිහිටි ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම, සුවිශේෂී ගැටළුවක් වී ඇත. එහෙයින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පැවරෙන සමාජ වගකීම ද දිනෙන් දින වර්ධනය වන බවක් පෙනෙන්නට තිබෙන හෙයින්, අපගේ වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා කාලීනව උපාය මාර්ගික සැලසුම්කරණ හා ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවේ.

ඒ අනුව ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවට නගමින් පෙර වර්ෂවලට වඩා පුළුල් ජාතික මෙහෙවරක් 2013 වර්ෂයේ ඉටු කරන්නට ලැබීම බලවත් වූ සතුටට කරුණකි.

එහිදී වගකීමෙන් යුතුව සුවිශාල කාර්යභාරයක් ඉටු කරන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සියළුම සාමාජිකයන් මෙන්ම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්යය මණ්ඩලය හා වැඩිහිටි නඩත්තු මණ්ඩලය ද පැසසුමට ලක් විය යුතුය.

එසේම වැඩිහිටියන්ගේ සුභසාධනය හා ඔවුන්ගේ රැකවරණය සැපයීමේ කාර්යයේදී නන් අයුරින් සහය වූ රාජ්‍ය නොවන සංවිධානවලට ද මාගේ කෘතඥතාවය පළ කරමි.

**ඉමෙල්ඩා සුකුමාර්**
ලේකම්
සමාජ සේවා අමාත්‍යාංශය
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2013

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයේ අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

**1. රු. 1000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව**

මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ වයස අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය සහ සුභසාධනය සැලසීමේ අරමුණින් 2012 අයවැය යෝජනා යටතේ වැඩිහිටි සුභසාධනය සඳහා අතිරේක ප්‍රතිපාදන රජය විසින් වෙන් කර දෙන ලදී.

වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 179910 කට පමණ 2013 වර්ෂයේදී රු. 1000/- දීමනාව ලබා දී ඇත.

**2. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූල්‍යාධාර සැපයීම.**

ග්‍රාමීය වැඩිහිටි කමිටු 1557 ක් හා ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 34 ක් සඳහා රුපියල් මිලියන 8.04 ක මූල්‍යාධාර ලබාදී ඇත.

**3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

වර්ෂය තුළ රුපියල් මිලියන 0.407 ක වියදමක් දරා වැඩිහිටියන් 15748 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

**4. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම.**

2013 වර්ෂය තුළ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 31 ක් සඳහා රුපියල් මිලියන 0.775 ක මුදලක් ලබාදී ඇත.

**5. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

ජාතික මට්ටමේ වැඩිහිටි උපදේශන කුසලතා සංවර්ධන දෙදින පුහුණු වැඩමුළු 06 ක් , පලාත් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් සහ විශ්‍රාම පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් ද සඳහා රුපියල් මිලියන 3.211ක මුදලක් වැය කර ඇත.

**6. නොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම.**

2013 වර්ෂය තුළ වැඩිහිටියන් 1782 දෙනෙකුට වෛද්‍ය නිර්දේශයන්ට අනුව අක්ෂිකාච නිකුත් කර ඇති අතර, 68 දෙනෙකුට ශ්‍රවණ උපකරණ ලබා දී තිබේ. වැය වූ මුදල රුපියල් මිලියන 4.01 කි.

**7. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"වැඩිහිටිභාවය සඳහා දිවිය පුරා සූදානමක්" යන තේමාව යටතේ 2013 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2013.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන් පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර, ඒ සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 6.12 කි.

**8. වැඩිහිටි නිවාසවලට මූලාධාර ලබාදීම.**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය සහ සංචාරක නිකේතනය සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1.698 ක මුදලක් වැයකර තිබෙන අතර, වැඩිහිටියන් 40 දෙනෙකු සඳහා එහි නේවාසික රැකවරණය ලබා ඇත.

**9. වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන**

දානපතියන්ගේ පරිත්‍යාග තුළින් 2013 වර්ෂයේදී එක් අයෙකුට මසකට රු. 250/- ක් වන පරිදි වැඩිහිටියන් 73 දෙනෙකුට අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

**10. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලය 46 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගෙන් පැමිණිලි 170 ක් අතරින් පැමිණිලි 133 ක් විසඳා අවසන් කරන ලදී. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2013 වර්ෂයේදී රුපියල් මිලියන 0.769 ක් වැය කොට ඇත.

**11. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

2013 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 12 ක් පවත්වා ඇත. වැයවූ මුදල රුපියල් මිලියන 0.733 කි.

2013 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 20 ද පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 76 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 9.2 ක් හා රු. මිලියන 70.83 පමණි. එම නිසා 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත ආකාරයෙන් කාර්ය සාධනය සපුරා ගැනීමට දුෂ්කර විය.

කෙසේ නමුත්, 2013 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 81.50 ක මුදලක් ද ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 9.395 ක් වැඩිහිටි සුභසාධන කටයුතු සඳහා ඍජුව වැය කර ඇත.

පී. කේ. එස්. සුභෝදිනී
අධ්‍යක්ෂ

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# 2013 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

## වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම.

| *දිස්ත්‍රික්කය* | *වැඩිහිටි නිවාසය* | *ගෙවන ලද මුදල (රු)* |
|---|---|---|
| මොණරාගල | කතරගම සංචාරක නිකේතනය | 1,254,673.75 |
| | කතරගම වැඩිහිටි නිවාසය | 375,319.50 |
| හම්බන්තොට | සරණ අන්ධ වැඩිහිටි නිවාසය | 150,000.00 |
| රත්නපුර | වලල්ගොඩ සරණ අන්ධ වැඩිහිටි නිවාසය | 498,000.00 |
| | කලවාන සෙවණ වැඩිහිටි නිවාසය | 1,000,000.00 |
| මඩකලපුව | කාත්තන්කුඩි වැඩිහිටි නිවාසය | 100,000.00 |
| මහනුවර | ගුරුළුපොත සරණ වැඩිහිටි නිවාසය | 96,438.18 |
| යාපනය | කයිතඩි වැඩිහිටි නිවාසය | 416,175.66 |
| අනුරාධපුරය | සාලියපුර වැඩිහිටි නිවාසය | 463,767.00 |
| ගම්පහ | මීරිගම රජයේ වැඩිහිටි නිවාසය | 164,934.00 |
| | මාලිගාතැන්න වැඩිහිටි නිවාසය | 12,360.00 |
| අම්පාර | උත්තලපුර වැඩිහිටි නිවාසය | 499,800.00 |
| *එකතුව* | | 5,031,468.09 |

## වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන් - 2013

| පළාත | දිස්ත්‍රික්කය | හැඳුනුම්පත් සංඛ්‍යාව | මුදල |
|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 243 | රු.6075/- |
| | කළුතර | 366 | රු. 9150/- |
| | ගම්පහ | 209 | රු. 7725/- |
| මධ්‍යම | මාතලේ | 1765 | රු.44125/- |
| | නුවරඑළිය | 764 | රු.20730/- |
| දකුණ | හම්බන්තොට | 767 | රු.19175/- |
| | මාතර | 389 | රු.9725/- |
| | ගාල්ල | 561 | රු.14025/- |
| නැගෙනහිර | මඩකලපුව | 238 | රු.5950/- |
| වයඹ | කුරුණෑගල | 2193 | රු.56075/- |
| | පුත්තලම | 238 | රු.5950/- |
| උතුරු මැද | අනුරාධපුර | 1078 | රු.26950/- |
| | පොළොන්නරුව | 637 | රු.15925/- |
| ඌව | බදුල්ල | 3281 | රු.89915/- |
| | මොණරාගල | 1602 | රු.40150/- |
| සබරගමුව | කෑගල්ල | 738 | රු.20950/- |
| | රත්නපුර | 469 | රු.11725/- |
| උතුර | මන්නාරම | 110 | රු.2750/- |
| **එකතුව** | | **15648** | **රු.407,070/-** |

## වැඩිහිටි කම්ටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2013

| පළාත | දිස්ත්‍රික්කය | රු 5000 ආධාර ලබාදුන් කම්ටු සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 108 |
| | කොළඹ | 106 |
| | ගම්පහ | 122 |
| මධ්‍යම | මහනුවර | 55 |
| | මාතලේ | 34 |
| | නුවරඑළිය | 30 |
| දකුණ | ගාල්ල | 150 |
| | මාතර | 79 |
| | හම්බන්තොට | 23 |
| උතුර | යාපනය | 36 |
| | වවුනියාව | 06 |
| | කිලිනොච්චි | 05 |
| | මන්නාරම | 02 |
| නැගෙනහිර | මඩකලපුව | 49 |
| | අම්පාර | 17 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | පුත්තලම | 86 |
| | කුරුණෑගල | 327 |
| සබරගමුව | රත්නපුර | 40 |
| | කෑගල්ල | 65 |
| ඌව | මොණරාගල | 21 |
| | බදුල්ල | 11 |
| උතුරු මැද | අනුරාධපුර | 109 |
| | පොළොන්නරුව | 59 |
| ***එකතුව*** | | **1557** |

## රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2013

| පලාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 03 |
| | කොළඹ | 02 |
| | ගම්පහ | 01 |
| දකුණ | ගාල්ල | 03 |
| | මාතර | 04 |
| | හම්බන්තොට | 01 |
| සබරගමුව | කැගල්ල | 03 |
| උතුර මැද | අනුරාධපුරය | 02 |
| | පොළොන්නරුව | 02 |
| මධ්‍යම | මහනුවර | 01 |
| | මාතලේ | 01 |
| ඌව | මොණරාගල | 01 |
| | බදුල්ල | 01 |
| වයඹ | කුරුණෑගල | 05 |
| | පුත්තලම | 02 |
| නැගෙනහිර | මඩකලපුව | 01 |
| උතුර | යාපනය | 01 |
| **එකතුව** | | **34** |

## දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම - 2013

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | උපකරණ මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම | |
|---|---|---|---|---|
| | | | මධ්‍යස්ථාන සංඛ්‍යාව | මුදල රු |
| බස්නාහිර | කළුතර | පාලින්දනුවර | 01 | 25,000/- |
| දකුණ | ගාල්ල | නියාගම | 01 | 25,000/- |
| | හම්බන්තොට | බෙලිඅත්ත | 01 | 25,000/- |
| වයඹ | කුරුණෑගල | පොල්පිතිගම | 01 | 25,000/- |
| | | මහව | 01 | 25,000/- |
| | | කුලියාපිටිය බටහිර | 01 | 25,000/- |
| | | කුරුණෑගල | 01 | 25,000/- |
| | | උඩුබද්දාව | 02 | 50,000/- |
| සබරගමුව | කෑගල්ල | ගලිගමුව | 01 | 25,000/- |
| | රත්නපුර | රත්නපුර | 02 | 50,000/- |
| මධ්‍යම | මහනුවර | උඩුනුවර | 01 | 25,000/- |
| | | මැදදුම්බර | 01 | 25,000/- |
| | නුවරඑළිය | අඹගමුව කෝරළේ | 05 | 125,000/- |
| ඌව | බදුල්ල | හපුතලේ | 09 | 225,000/- |
| නැගෙනහිර | අම්පාර | දමන | 01 | 25,000/- |
| | ත්‍රිකුණාමලය | කින්නියා | 01 | 25,000/- |
| | | කන්තලේ | 01 | 25,0000/- |
| **එකතුව** | | | **31** | **775,000/-** |

## විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම - 2013

| පවත්වන ලද ස්ථානය | වැඩමුළු ප්‍රමාණය | ප්‍රතිලාභීන් | මුදල (රු.) |
|---|---|---|---|
| කොබ්බෑකඩුව, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය | 01 | 150 | රු 301,134/- |
| රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 175 | රු 110,000/- |
| **එකතුව** | **02** | **325** | **රු 411,134/-** |

## ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාර සේවා ලබාදීමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරා ගන්නා ලද 135ක පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳ සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විට විශේෂයෙන්ම බස්නාහිර පළාත තුල ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබා ගැනීමට මාහැඟි අවස්ථාවක් උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු 600.00 බැගින් නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි කාන්තා හෝ පිරිමි සේවාදායකයකු ලබාගත හැක. එසේම සේවයේ යොදවන සියළු වැඩිහිටි සත්කාරකයන් ආචාරධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.
සමාජ සේවා අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැළසුම්කර මෙහෙයවන අතර පුහුණුව සාර්ථකව අවසන් කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වෙච්ඡා සේවකයන්ගේ සේවය තුළින් ලබා ගැනීමට හැකි වී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයෙකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකි වීම නිසා වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවක පුහුණුව ලැබූවන්හටද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත්වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටියන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස් කර තිබේ.

# වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 4 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී/සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදිමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිමට කැමති අයෙකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.
මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහගු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2013 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 1 | ඩබ්. යමුනා චිත්‍රාංගනී මෙනවිය | 11 | අයි. සී. මැගිලින් ප්‍රනාන්දු | ඉබ්බාගමුව |
| | | | ආර්. වයි. පී. ගුණවතී මිය | ගලගෙදර |
| | | | එච්. ජයවතී මිය | බුලත්සිංහල |
| | | | ඒ. ඩී. කමලාවතී මිය | බුලත්සිංහල |
| | | | ඩබ්. පී. ලීලාවතී මිය | තිස්සමහාරාමය |
| | | | ඩී. බී. ජේන්නෝනා මිය | රිදීගම |
| | | | විනී ප්‍රනාන්දු මිය | පානදුර |
| | | | ඒ. පී. ධර්මවර්ධන මයා | දැරණියගල |
| | | | ඒ. ඩබ්. මැගිලින් රුද්‍රිගෝ මිය | මාස්පොත |
| | | | පී. තෙරේසා ඩිලෙක් මිය | කැළණිය |
| | | | එම්. පී. ඩිංගිරි අම්මා | කුණ්ඩසාලේ - මැණික්හින්න |
| 2 | ආනන්ද තිලකසිරි මහතා | 10 | එම්. ඒ. ඥානවතී මිය | සෙවනගල |
| | | | ආර්. එම්. ඩිංගිනා මිය | සෙවනගල |
| | | | එම්. පී. අනගි මිය | මිනුවන්ගොඩ |
| | | | යූ. පී. ඩිංගිරි මැණිකේ මිය | උඩුගම්පළ |
| | | | ඒ. ඩබ්. පී. බේබිනෝනා මිය | දෙවිනුවර |
| | | | එම්. වී. පියසේන මයා | දෙවිනුවර |
| | | | ඒ. ඩබ්. පී. කුසුමාවතී මිය | දෙවිනුවර |
| | | | තම්බිමුත්තු ඉලේතම්බි මයා | සමන්තුරෙයි |
| | | | අබුරන් මුඩියප්පු මයා/ ආර්. පී. ඩී. උක්කු මිය | ඩෙල්ෆ්/ පඩුවස්නුවර |
| | | | පී. එම්. ලිලී මිය/ එච්. පී. ප්‍රේමදාස මයා | කැළණිය |
| 3 | එඩ්වඩ් පෙරේරා මහතා | 08 | ඩී. පී. බී. එම්. රංදොහාමි | පඩුවස්නුවර බටහිර |
| | | | කේ. එම්. රංදොහාමි | පඩුවස්නුවර බටහිර |
| | | | ජේ. ඒ. විනිප්‍රිඩා පෙරේරා | කළුතර |
| | | | පී. ඒ. පියසේන මය | කාර්යාලයට පැමිණ මුදල් ලබා ගනී |
| | | | ඩී. බී. දනෝරිස් මයා | සෙවනගල |
| | | | ඊ. ඒ. ඩේගින් සිංඤෝ මයා | සෙවනගල |
| | | | එස්. හුරතලී මිය | කොළොන්න |
| | | | ඊ. එම්. බණ්ඩාර මැණිකේ | මාවතගම |
| 4 | ඒ. බී. පෙරේරා මහත්මිය | 01 | එම්. ජේ. සේතන් සිංඤෝ මයා | නිට්ටඹුව |
| 5 | ජේ. ඒ. ඩී. ලෙනාඩ් රෝහණ මහතා | 01 | ජේ. ඒ. ඩී. එමලින් නෝනා මිය | බියගම |
| 6 | සෝමා කුලතුංග මහත්මිය | 03 | ඒ. අන්තෝනි මයා | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඊ. වයලට් නෝනා මිය | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| | | | කේ. ඒ. පොඩිහාමිනේ මිය | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| 7 | ජයන්ත පුංචිහේවා මහතා | 01 | කේ. මේරිනෝනා මිය | කැස්බෑව |
| 8 | ලලනි පෙරේරා මහත්මිය | 02 | කේ. එම්. බණ්ඩාර මැණිකේ | පාතහේවාහැට |
| | | | ඩබ්. දිනුහාමි මිය | පොල්පිතිගම |
| 9 | එස්. ප්‍රියංගිකා සිල්වා මහත්මිය | 01 | එම්. එම්. අබේරත්න මයා | තඹුත්තේගම |
| 10 | එස්. ඒ. හින්ට්ඩ් මහත්මිය | 08 | ජී. ආර්. සාදිනෝනා මිය | වරකාපොල |
| | | | අයි. ජී. සොයිදා මයා | වරකාපොල |
| | | | එම්. පී. පොඩිනෝනා මිය | වරකාපොල |
| | | | ඩබ්. එච්. ලිලියා මිය | වරකාපොල |
| | | | ජේ. පී. ලැයිසා මිය | වරකාපොල |
| | | | ඒ. සිම්යොන් මයා | මීගමුව |
| | | | ඒ. අමරසිරි ද සිල්වා මයා | මීගමුව |
| | | | ජේ. එම්. ඇඩ්මන් මයා | මීගමුව |
| 11 | එන්. ඒ. ප්‍රනාන්දු මහත්මිය | 06 | එම්. පීටර් පෙරේරා මයා | මහරගම |
| | | | ආර්. ඒ. කුසුමාවතී මිය | මහරගම |
| | | | ඒ. හේමපාල වික්ටර් මයා | මහරගම |
| | | | ඩබ්. ඩී. ධර්මදාස මයා | මහරගම |
| | | | ඒ. වික්ටර් මයා | මහරගම |
| | | | කේ. බී. ඇසිලින් නෝනා මිය | මහරගම |
| 12 | ඩී. තම්තේගම මයා | 04 | එම්. ඩී. ලීලාවතී මිය | මහ කුඹුක්කඩවල |
| | | | ආර්. ඩී. පිනී මිය | ගිරිබාව |
| | | | එච්. එම්. හාමිනෝනා මිය | ගිරිබාව |
| | | | ආර්. එම්. ඥානලතා මිය | පොලගහවෙල |
| 13 | ආර්. එම්. කුසුමා කුමාරි මහත්මිය | 01 | ඒ. සුමනාවතී මිය | මිහින්තලේ |
| 14 | ඩබ්. එම්. වත්සලා මහත්මිය | 01 | ජී. අස්පත්තියේගෙදර මිය | වත්තේගම |
| 15 | ඒ. එම්. ආර්. ඒ. ජයසුන්දර මහත්මිය | 01 | ආර්. ඇගිනෝනා මිය | කඩුවෙල |
| 16 | නන්දා කරුණාසේන මහත්මිය | 01 | එල්. ඒ. හීන්හාමි | කැළණිය |
| 17 | සුනිලා පෙරේරා මහත්මිය | 01 | අයි. දෝන ඇග්නස් මිය | කැළණිය |
| 18 | තරංගා කරුණාසේන මහත්මිය | 01 | අයි. ඇන්සිනෝනා මිය | කැළණිය |
| 19 | එම්. පී. ගුණදාස මහත්මිය සහ එම්. ඩී. අයි. යූ. ගුණදාස මෙනවිය | 2 | ඒ. සෝමා ගුණවර්ධන මිය | මිනුවන්ගොඩ |
| | | | එම්. පී. විපුලසේන මයා | මිනුවන්ගොඩ |
| 20 | කේ. පී. නිශාන්ත මයා | 01 | එම්. පී. ඇසිලින් නෝනා මිය | දොම්පේ |
| 21 | එම්. එස්. එම්. අෂ්රොෆ් මයා | 01 | අබ්දුල් රස්වාන් මයා | කළුතර |
| 22 | සීලා පියසිංහ මහත්මිය | 01 | එච්. එම්. හේරත්මැණිකේ මිය | ඉබ්බාගමුව |
| 23 | ඉන්ද්‍රානි සෙනවිරත්න මිය | 01 | යසවතී වෙත්තසිංහ මිය | මහරගම |
| 24 | දිලූපා කරුණාරත්න මහත්මිය | 01 | නෝබට් විමලරත්න මයා | පිළියන්දල |
| 25 | විනීතා මල්ලිකා මහත්මිය | 01 | පී. ඒ. සුමනා පෙරේරා මිය | තිඹිරිගස්යාය |
| 26 | ඩී. පී. වික්‍රමාරච්චි මහත්මිය | 01 | එම්. තුසිත රත්න සිල්වා මයා | බලපිටිය |
| 27 | හවීන්ද්‍ර කල්දේරා මහතා | 02 | එච්. බී. පිත්සොහාමි මිය | මාලිම්බඩ |
| | | | ඩබ්. ජී. ගුණවතී මෙනවිය | කුණ්ඩසාලේ |

## කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු-2013

| මාසය | කාමර වෙන් කළ ප්‍රමාණය | ආදායම රු. | වියදම් | | | |
|---|---|---|---|---|---|---|
| | | | ජල බිල්පත් රු. | විදුලි බිල්පත් රු. | පවිත්‍ර රු. | වෙනත් |
| ජනවාරි | 14 | 16,600.00 | 6832.00 | 2092.50 | 15,500.00 | - |
| පෙබරවාරි | 35 (F.Hසමග) | 24,300.00 | 14,576.80 | 1,653.75 | 15,892.85 | - |
| මාර්තු | 15 | 11,800.00 | | | | |
| | 3 | 2,100.00 | 6,328.00 | 1,088.26 | 16,500.00 | - |
| අප්‍රේල් | 23 | 24,700.00 | 4,172.00 | 2,799.38 | 16,500.00 | |
| මැයි | 30 | 26,200.00 | 9,016.00 | 1,336.88 | 16,500.00 | 275.045.00 |
| ජූනි | 11 | 10,600.00 | 8,260.00 | 1,215.01 | 16,500.00 | |
| ජූලි | 08 | 6,400.00 | 6,832.00 | 1,093.13 | 16,500.00 | |
| අගෝස්තු | 55 | 55,000.00 | 8,176.00 | 2,604.38 | 16,500.00 | |
| සැප්තැම්බර් | 32 | 37,400.00 | 12,728.80 | 4,627.50 | 16,500.00 | |
| ඔක්තෝබර් | 27 | 26,200.00 | 6,412.00 | 3,384.38 | 16,500.00 | |
| නොවැම්බර් | 47 | 21,700.00 | 9,520.00 | 2,458.13 | 16,500.00 | 375,319.50 |
| දෙසැම්බර් | 56 | 47,100.00 | 16,256.80 | 2,896.88 | 16,500.00 | 715,465.00 |
| ***එකතුව*** | | ***310,100.00*** | ***109,110.40*** | ***27,250.18*** | ***196,392.85*** | ***1,365,829.50*** |

# ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත් කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්මවූ තම දරුවන් ඥාතින් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථසාදක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කර ගනු ලබන අතර, දිගු කාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් වෙත ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරයි.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රුපියල් 500/- බැගින් ප්‍රතිලාභීන් 89 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබා දෙන ලදී.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්ය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්මවූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුනු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපීම් අවශ්‍යතා ආදී සියළු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද (Adoped Child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙළෙන්නේ නම් මෙම පනතේ 24(I) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියා පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටළු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝගය නඩත්තු අඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2013

| | |
|---|---|
| 2013 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි | - 181 |
| | ↓ |
| ප්‍රමාණවත් විස්තර ලැබී නොමැති පැමිණිලි | - 07 |
| ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි | - 70 |
| ඒ අනුව අවසානය තෙක් විභාග කළ පැමිණිලි | - 104 |

| | | |
|---|---|---|
| මණ්ඩලය විසින් සමථයට පත් කළ පැමිණිලි | - 48 | 104 |
| විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කළ හා ඉඩ ලබා දිය නොහැකි පැමිණිලි | - 23 | |
| ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි | - 08 | |
| දැනට විභාග වෙමින් පවතින පැමිණිලි | - 25 | |

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

සභාපති - ඩඩ්ලි කරුණාරත්න මයා

ලේකම් - එම්. පී. පුංචිබණ්ඩා මයා

**මණ්ඩලයේ සාමාජික**

1. හසලි රාජපක්ෂ මයා
2. ආචාර්ය ලීල් ගුණසේකර මයා
3. කේ. මර්කණ්ඩු මයා
4. ඒ. ආර්. ඒ. එම්. ලාෆීර් මයා

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

## පොදු ගිණුම් ප්‍රතිපත්ති

(අ) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව පිළියෙළ කර ඇත.

(ඇ) රජයේ ප්‍රදානයන්

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය වෙළඳ නොවන ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලබයි.

මහාභාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කෙරේ.

**ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්.**

(අ) ක්ෂය ප්‍රතිපත්ති

I. මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

II. පහත පරිදි සරළ මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| වාහන සඳහා | - | 10% |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සඳහා | - | 15% |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා | - | 20% |

(ආ) ප්‍රාග්ධන හා පුනරාවර්ථන මුදල් ලැබීම් මූල්‍ය වාර්තාව තුළ ඇතුළත් කොට ඇත.

(ඇ) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම්වලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී.

ඇමුණුම - 1 ඒ

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| 2012 | විස්තරය | සටහන | පිරිවැය 2013 (රු.) | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදනය 2013 (රු.) | 2013 (රු.) ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|
| | **ස්ථාවර වත්කම්** | | | | |
| 2,004,902.94 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 12,745,759.19 | 7,114,398.56 | 5,631,360.63 |
| 14,145,000.00 | වාහන | | 16,550,000.00 | 4,060,000.00 | 12,490,000.00 |
| 577,404.80 | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | | 3,969,075.40 | 2,385,459.88 | 1,583,615.52 |
| | | | 33,264,834.59 | 13,559,858.44 | 19,704,976.15 |
| 16,727,307.74 | | | | | 5,871,795.65 |
| 5,219,373,90 | ආයෝජන - ස්ථාවර තැන්පත් | | | | |
| | **ජංගම වත්කම්** | | | | |
| 442,107.84 | පරිලේඛන/බඩු තොග | 10 | 610,411.26 | | |
| 1,000.00 | නොපියවූ අත්තිකාරම් | | - | | |
| 62,500.00 | නොපියවූ උත්සව අත්තිකාරම් | 11 | 60,000.00 | | |
| 32,597.48 | නොපියවූ ආපදා අත්තිකාරම් | | - | | |
| 3,257,884.00 | කාර්ය මණ්ඩලය සඳහා ණය | 12 | 3,521,896.00 | | |
| 943,849.56 | මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 8 | 697,839.40 | 4,890,146.66 | |
| **26,686,620.52** | **මුළු ජංගම වත්කම්** | | | | |
| | **වගකීම්** | | | | |
| | **ජංගම වගකීම්** | | | | |
| 50,000.00 | විගණන ගාස්තු වෙන්කිරීම් | | 100,000.00 | | |
| 5,854,110.50 | පාරිතෝෂිත වෙන්කිරීම | 13 | 7,381,809.00 | | |
| 130,455.72 | කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල | 14 | 276,922.77 | | |
| 1,519,310.53 | පොදු තැන්පත් | 15 | 4,319.359.33 | | |
| 9,527,771.61 | උපචිත වියදම් | 9 | 7,666,529.16 | | |
| | ආපසු ලබා දිය යුතු සේවක ණය | | 520.00 | 19,745,140.26 | (14,854,993.60) |
| | **ශුද්ධ ජංගම වත්කම්** | | | | |
| | | | | | 10,721,778.20 |
| 26,686,620.52 | **මුළු වත්කම්** | | | | |
| | ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | | |
| 16,175,474.46 | සංචිත අරමුදල | | | 40,320.88 | |
| (4,403,098.82) | එකතු කළා : පෙර වර්ෂයේ ගැලපුම් | | (1,000.00) | | |
| 11,772,375.64 | | | | 39,320.88 | |
| (12,176,526.22) | | | | (8,737,765.71) | (8,698,444.83) |
| | එකතු/අඩු ශුද්ධ අතිරික්තය | | | | |
| | රජයේ ප්‍රදානයන් - (මූලධන) | | | | 9,200,000.00 |
| | සංචිත | | | | |
| | ස්ථාවර තැන්පත් පොලී | | | | 652,421.75 |
| | භාණ්ඩාගාරයේ ප්‍රදානයන් - (වාහන) | | | 9,100,000.00 | 9,100,000.00 |
| | ලෝක සෞඛ්‍ය සංවිධානයේ පරිත්‍යාග | 16 | | 104,613.52 | 104,613.52 |
| 360,037.76 | වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | 17 | | | 363,187.76 |
| **9,604,972.16** | **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** | | | | **10,721,778.20** |

අත්සන් කළේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ (වැ.බ)

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව　　　　ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 බී

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් වාර්තාව

| 2012 | විස්තරය | සටහන | 2013 (රු.) | 2013 (රු.) |
|---|---|---|---|---|
| | **මෙහෙයුම් ආදායම්** | | | |
| 65,345,528.54 | රාජ්‍ය ප්‍රදාන | | 70,830,000.00 | |
| 182,379,000.00 | අමාත්‍යාංශ ප්‍රදාන | | - | |
| 1,401,166.48 | ලෝක සෞඛ්‍ය සංවිධානය | | - | 70,830,000.00 |
| | **වෙනත් ආදායම්** | | | |
| 408,890.97 | ස්ථාවර තැන්පතු පොලිය | | - | |
| 900.00 | පරිත්‍යාග | | - | |
| 772,051.96 | විවිධ ආදායම් | | 402,005.69 | 402,005.69 |
| **250,307,537.95** | | | | **71,232,005.69** |
| | **මෙහෙයුම් වියදම්** | | | |
| 36,167,278.59 | පුද්ගල පඩි නඩි | 1 | 38,909,046.78 | |
| 1,831,102.12 | ගමන් වියදම් | 2 | 628,279.99 | |
| 1,841,905.30 | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 3 | 735,667.97 | |
| 376,009.88 | නඩත්තු වියදම් | 4 | 533,226.30 | |
| 7,762,773.43 | ගිවිසුම්ගත සේවා | 5 | 5,053,370.96 | |
| 211,713,759.87 | වෙනත් මෙහෙයුම් වියදම් | 6 | 30,458,670.69 | |
| 2,791,234.98 | ක්ෂය ප්‍රමාණය | 7 | 3,651,508.71 | |
| **262,484,064.17** | **මුළු මෙහෙයුම් වියදම්** | | | **79,969,771.40** |
| **(12,176,526.22)** | **අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය** | | | **(8,737,765.710)** |
| | | | | |

අත්සන් කළේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 සී

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | 2013 (රු.) | 2013 (රු.) |
|---|---|---|
| **<u>මෙහෙයුම් කටයුතු තුළින් වූ අරමුදල් ප්‍රවාහය</u>** | | |
| මෙහෙයුම් ක්‍රියාවලි අතිරික්තය/ඌණතාවය | (8,737,765.71) | |
| **මූල්‍යමය නොවන කාර්යයන්** | | |
| ක්ෂය වීම් | 3,651,508.71 | |
| **ජංගම වත්කම්** | | |
| වර්ෂ අවසාන තොග වැඩිවීම | (168,303.42) | |
| **ජංගම වගකීම්** | | |
| පාරිතෝෂික | 1,527,698.50 | |
| සේවක ණය ඉතිරියේ වැඩිවීම | (264,012.00) | |
| නොපියවූ ආපදා අත්තිකාරම් අඩුවීම | 32,597.48 | |
| නොපියවූ උත්සව අත්තිකාරම් අඩුවීම | 1,500.00 | |
| ස්ථාවර වත්කම් පොලී වැඩිවීම | (652,421.75) | |
| නොපියවූ අත්තිකාරම් අඩුවීම | 1,000.00 | |
| විගණන ගාස්තු වෙන්කිරීම් වැඩිවීම | 50,000.00 | |
| සේවක ණය අරමුදල වැඩිවීම | 146,467.05 | |
| පොදු තැන්පත්වල වැඩිවීම | 2,800,048.80 | |
| උපචිත වියදම්වල අඩුවීම | (1,861,242.45) | |
| ආපසු ලබාදිය යුතු සේවක ණය වැඩිවීම | 520.00 | |
| පසුගිය වසරේ ගැලපුම් කිරීම් | - | |
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,472,404.79)** |
| **ආයෝජන කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් ශුද්ධ පොලී | 652,421.75 | |
| දේපල, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම්වල මිළදී ගැනීම් | (6,629,177.12) | |
| | | **(5,976,755.37)** |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන - (මූලධන) | 9,200,000.00 | |
| භාණ්ඩාගාරයේ ප්‍රදාන - (වාහන) | - | |
| ලෝක සෞඛ්‍ය සංවිධාන අරමුදල | - | |
| වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | 3,150.00 | |
| | | **9,203,150.00** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ අතිරික්තය/ඌණතාවය** | | **(246,010.16)** |
| කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | | **943,849.56** |
| කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | | **697,839.40** |

අත්සන් කළේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# උප ලේඛන

| 2012 රු. | සටහන් 01 | | පුද්ගලික පඩි නඩි | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 21,063,628.80 | | (I) | වැටුප් හා වේතන | 21,609,505.29 |
| 3,279,334.21 | | (II) | සේවක අර්ථසාදක අරමුදල | 3,451,767.26 |
| 819,833.36 | | (III) | සේවක භාරකාර අරමුදල | 862,941.56 |
| 434,119.87 | | (IV) | අතිකාල | 526,636.77 |
| 43,263.18 | | (V) | නිවාඩු දින වැටුප් | 42,173.25 |
| 7,364,847.41 | | (VI) | ජීවන වියදම් දීමනා | 8,428,803.22 |
| 3,162,251.76 | | (VII) | ජීවන වියදම් දීමනා | 3,987,219.43 |
| **36,167,278.59** | | | **එකතුව** | **38,909,046.78** |

| 2012 රු. | සටහන් 02 | | ගමන් වියදම් | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 1,726,508.60 | | (I) | දේශීය | 628,279.99 |
| 104,593.52 | | (II) | විදේශීය | - |
| **1,831,102.12** | | | **එකතුව** | **628,279.99** |

| 2012 රු. | සටහන් 03 | | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 1,357,091.05 | | (I) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 310,941.12 |
| 481,019.25 | | (II) | ඉන්ධන හා ලිහිසි තෙල් | 404,726.85 |
| 3,795.00 | | (III) | නිල ඇඳුම් | 20,000.00 |
| **1,841,905.30** | | | **එකතුව** | **735,667.97** |

| 2012 රු. | සටහන් 04 | | නඩත්තු වියදම් | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 344,127.59 | | (I) | වාහන | 455,161.80 |
| 31,882.29 | | (II) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 78,064.50 |
| **376,009.88** | | | **එකතුව** | **533,226.30** |

| 2012 රු. | සටහන් 05 | | ගිවිසුම් සේවා | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 6,410.00 | | (I) | ප්‍රවාහන | 85,000.00 |
| 556,349.49 | | (II) | තැපැල් හා විදුලි සංදේශ සේවා | 354,161.51 |
| 880,895.54 | | (III) | විදුලිය සහ ඉන්ධන | 696,760.81 |
| 3,069,345.73 | | (IV) | බදු කුලී | - |
| 150,338.00 | | (V) | පිරිසිදු කිරීමේ ගාස්තු | 53,463.92 |
| 59,705.00 | | (VI) | පුවත්පත් | 30,263.00 |
| 254,380.76 | | (VII) | සංග්‍රහ වියදම් | 25,116.50 |
| 74,797.00 | | (VIII) | විගණන ගාස්තු | 50,000.00 |
| 264,569.31 | | (IX) | ආරක්ෂක වියදම් | - |
| 409,503.00 | | (X) | ජාතික සභාව සඳහා දිමනා | 733,457.36 |
| 1,103,014.00 | | (XI) | නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | 700,597.00 |
| 511,631.00 | | (XII) | අනෙකුත් දීමනා | 786,802.36 |
| - | | (XIII) | බැංකු ගාස්තු | 10,050.00 |
| 421,834.50 | | (XIV) | පාරිතෝෂිකය | 1,527,698.50 |
| **7,762,773.43** | | | **එකතුව** | **5,053,370.96** |

| 2012 රු. | සටහන් 06 | | වෙනත් මෙහෙයුම් වියදම් | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 5,685,602.00 | | (I) | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 6,425,811.00 |
| 571,797.00 | | (II) | හැදුනුම්පත් නිකුත් කිරීම | 411,690.00 |
| 974,389.00 | | (III) | දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබා දීම | 336,995.00 |
| 538,847.20 | | (IV) | ප්‍රකාශන | 154,000.00 |
| 1,062,380.00 | | (V) | පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 3,108,601.37 |
| 8,005,650.00 | | (VI) | වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම | 5,098,500.00 |
| 791,448.00 | | (VII) | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | 5,837,470.80 |
| 1,247,951.65 | | (VIII) | වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | 1,299,056.09 |
| - | | (IX) | වෙනත් වියදම් | 2,516,791.33 |
| 8,734,528.54 | | (X) | වැඩිහිටි නිවාස අළුත්වැඩියාව සහ නඩත්තුව | 4,743,161.10 |
| 321,000.00 | | (XI) | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 526,594.00 |
| 1,401,166.48 | | (XII) | ලෝක සෞඛ්‍ය සංවිධානය | - |
| 182,379,000.00 | | (XIII) | රු 1000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දිමනාව | - |
| **211,713,759.87** | | | **එකතුව** | **30,458,670.69** |

| 2012 රු. | සටහන් 07 | | ක්ෂය ප්‍රමාණය | 12/31/2013 රු. |
|---|---|---|---|---|
| 20,232.58 | | (I) | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,474,953.03 |
| 1,655,000.00 | | (II) | වාහන | 1,655,000.00 |
| 216,002.40 | | (III) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 521,555.68 |
| **2,791,234.98** | | | **එකතුව** | **3,651,508.71** |

| 2012<br>රු. | සටහන්<br>08 | | බැංකු ගිණුම් | 12/31/2013<br>රු. |
|---|---|---|---|---|
| 195,564.17 | | (I) | බැංකු ශේෂය - ගි/අ - 228075 | 63,428.96 |
| 321,451.04 | | (II) | බැංකු ශේෂය - ගි/අ - 228075 | 204,426.09 |
| 426,834.35 | | (III) | බැංකු ශේෂය - ගි/අ - 228075 | 429,984.35 |
| **943,849.56** | | | **එකතුව** | **697,839.40** |

| 2012<br>රු. | සටහන්<br>09 | | උපචිත වියදම් | 12/31/2013<br>රු. |
|---|---|---|---|---|
| 793,655.00 | | (I) | ගෙවිය යුතු ගමන් වියදම් | 97,403.00 |
| 86,510.00 | | (II) | ගෙවිය යුතු හැඳුනුම්පත් දීමනා | 52,675.00 |
| - | | (III) | ගෙවිය යුතු මුද්‍රණ වියදම් | 154,000.00 |
| - | | (IV) | ගෙවිය යුතු අතිකාල | 49,075.14 |
| 56,800.00 | | (V) | ගෙවිය යුතු ජාතික සභා දීමනා | - |
| 45,277.77 | | (VI) | ගෙවිය යුතු තැපැල් හා දුරකතන ගාස්තු | 9,230.94 |
| 54,868.20 | | (VII) | ගෙවිය යුතු ආරක්ෂක ගාස්තු | - |
| 10,080.00 | | (VIII) | ගෙවිය යුතු පිරිසිදු කිරීමේ ගාස්තු | - |
| 4,390.00 | | (IX) | ගෙවිය යුතු පුවත්පත් වියදම් | 2,140.00 |
| 2,793,900.00 | | (X) | ගෙවිය යුතු අක්ෂි කාච හා සෞඛ්‍ය සායන වියදම් | 792,000.00 |
| 114,204.79 | | (XI) | ගෙවිය යුතු විදුලි හා ජල බිල්පත් | - |
| 549,389.00 | | (XII) | ගෙවිය යුතු දිවා මධ්‍යස්ථාන ආධාර | 99,000.00 |
| - | | (XIII) | ගෙවිය යුතු වැඩිහිටි නිවාස ආධාර | 102,588.81 |
| 50,731.85 | | (XIV) | ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම් | 301,777.04 |
| 1,413,015.00 | | (XV) | ගොඩනැගිලි වෙන්කිරීම් | 386,361.83 |
| 3,555,000.00 | | (XVI) | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 1,707,450.00 |
| - | | (XVII) | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | 93,664.00 |
| - | | (XVIII) | බැංකු ගාස්තු | 750.00 |
| - | | (XIX) | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2,290,647.00 |
| - | | (XX) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 1,527,766.40 |
| **9,527,771.61** | | | **එකතුව** | **7,666,529.16** |

# විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 01 දින නිකුත් කරනලදී.

## තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්II/බී/එන්සීඑ/1/13/04    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 ජනවාරි 31 දින

සභාපති,

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 01 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැකසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 21(ඇ) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම්/ස්කන්ධයන් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

3

(ආ) වත්කමක ක්ෂය කළහැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය මුළුල්ලේ ක්‍රමාණුකූල පදනමකින් ක්ෂය කළ යුතු නමුත් සභාව විසින් වත්කම් මිලදීගත් වර්ෂයේ ක්ෂය කිරීම හා ඉවත්කරන වර්ෂයේ ක්ෂය නොකිරීම යන ප්‍රතිපත්තිය මත ක්ෂය ගණනය කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පත් පොළී ආදායම් රු. 652,422 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස නොගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වාහනවල සමුච්චිත ක්ෂය වෙන්කිරීම්වල නිවැරදි එකතුව රු. 4,495,000 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සමුච්චිත ක්ෂය වෙන්කිරීම් රු. 4,060,000 ක් ලෙස දක්වා තිබීම හේතුකොට ගෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර වත්කම් රු. 435,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී මිලදී ගත් රු. 4,912,472 ක් වටිනා කැමරා 356 ක් ලී බඩු උපකරණ ලෙස ගිණුම් ගත කර තිබිණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

2013 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම යටතේ රු. 610,411 ක් දක්වා දී තිබුණද එම උප ලේඛනයේ එකතුව රු. 556,511 ක් වූ බැවින් රු. 53,900 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ත්‍රිවීල් රථය | 250,000 | වාහන ලිපිගොනුව<br>සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ආ) ග්‍රාමීය වැඩිහිටි කමිටු බැංකු ශේෂ | 472,500 | කමිටු 135 කගේ සනාථ කිරීම් |
| (ඇ) වැඩිහිටි හැඳුනුම්පත් සඳහා ඡායාරූප | 15,748 | වියදම් සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු |

2.3

## 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 8 (1) වගන්තිය | 2013 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. |
| (ii) 14(3) වගන්තිය | 2012 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| (i) 2.11 වගන්තිය | සෑම මාස 06 කට වරක්ම ඉන්ධන දහනය පරීක්ෂා කළයුතු වූවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 2.12 වගන්තිය | සංචිත වාහනවලට ඉන්ධන ලබාගැනීමේදී මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කළයුතු වූවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2002 පෙබරවාරි 22 දිනැති අංක 01/2002, 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 හා 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනයේ නම හා රාජ්‍ය ලාංඡනය වාහනයේ මුද්‍රණය කළයුතු වූවත් එසේ කර නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | ආයතනය සතු මෝටර් රථ දෙකක් සමාජ සේවා අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. |
| (ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.12,745,759 ක ලී බඩු උපකරණ හා රු.3,969,075 ක යන්ත්‍ර උපකරණ වලට අදාළව විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.8,737,766 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,176,526 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,438,760 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ඉදිරිපත් කරන ලද ගිණුම අනුව රජයේ ප්‍රදාන රු.5,484,471 කින් වැඩිවීම, මෙහෙයුම් වියදම් රු.182,514,293 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් මෙම වර්ධනයට ඉවහල් වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙනත් මෙහෙයුම් වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.181,255,089 කින් අඩු වී තිබුණු අතර වැඩිහිටියන්ට රු.1,000 ක දීමනාව මාසිකව ලබා දීමේ වැඩසටහන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම එයට හේතු වී තිබුණි.

(ආ) ගිවිසුම් ගත සේවා සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම් පූර්ව වර්ෂය සමඟ සැසඳීමේදී රු.2,709,402 කින් හෙවත් සියයට 35 කින් අඩු වී ඇති අතර ගොඩනැගිලි කුළී සඳහා පූර්ව වර්ෂයේ ගෙවන ලද රු.3,069,346 ක මුදල සමාලෝචිත වර්ෂයේ ශුන්‍ය අගයක් ගැනීම මේ සඳහා බලපා තිබේ.

4. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

4.1 කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම
-------------------------------------------

ග්‍රාමීය වැඩිහිටි කමිටු 570 ක් සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩිහිටි කමිටු 20 ක් වශයෙන් කමිටු 590 ක් සඳහා රු.6,150,000 ක් මූල්‍යාධාර සැපයීමට ඉලක්ක කර තිබූ අතර ප්‍රගති වාර්තාවන්ට අනුව, රු.5,000 බැගින් ග්‍රාමීය වැඩිහිටි කමිටු 1557 ක් සඳහා රු.7,785,000 ක් ලබාදිය යුතු වුවද සත්‍ය වශයෙන් රු.7,500 බැගින් ප්‍රාදේශීය කමිටු 34 ක් සඳහා රු.255,000 ආධාර ලබාදී තිබිණි. නමුත් ප්‍රගති වාර්තාවල ප්‍රාදේශීය කමිටු 20 කට රු.150,000 ක් ආධාර ලබා දුන් බව දක්වා තිබූ බැවින් සත්‍ය ප්‍රමාණයට වඩා ප්‍රගති වාර්තා වල කමිටු 14 කට රු.105,000 මුදල් ලබාදීම අඩුවෙන් දක්වා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

6

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම

---

වැඩිහිටි හැඳුනුම්පත් 50,000 ක් නිකුත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,000,000 ක් වෙන් කර තිබුණ අතර ප්‍රගති වාර්තාවල රු.446,000 ක වියදමක් දරා වැඩිහිටි හැඳුනුම්පත් 17,821 නිකුත් කර තිබූ නමුත් පොත්පත් හා වාර්තා අනුව නිකුත් කල ජායාරූප ප්‍රමාණය 15748 ක් විය.

(ඇ) වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් යෙදවීම

---

වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 36 ක් සඳහා රු. 2,000,000 ක් වෙන් කර තිබුණ අතර රු.782,000 ක වියදමින් දිවා මධ්‍යස්ථාන 31 ක් වෙනුවෙන් මුදල් යොදවා තිබුණි. සැලසුමට වඩා දිවා මධ්‍යස්ථාන 05 කට අඩුවෙන් මුදල් යොදවා තිබුණු අතර මූල්‍ය ප්‍රගතිය සියයට 39 කි.

(ඈ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම

---

දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 138 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය අවසානය වන විට පවත්වා තිබුණේ එම වැඩසටහන් 4 ක් බැවින් භෞතික ප්‍රගතිය සියයට 3 ක් විය.

(ඉ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුනොකළ කාර්යයන්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය මට්ටමින් වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 100 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය තුළ එක් වැඩසටහනක්වත් පවත්වා නොතිබුණි.

(ii) ශ්‍රී ලංකාවේ දිනෙන් දින වර්ධනය වන වැඩිහිටි ජනගහණය වෙනුවෙන් අවශ්‍ය වන්නාවූ සුභ සාධනය, රැකවරණය හා හෙද සේවය ගෘහස්ථ මට්ටමින් සැපයිය හැකි ශ්‍රමිකයන් කණ්ඩායමක් පුහුණු කර සමාජගත කිරීමේ අරමුණින් පුහුණු පාඨමාලා 04 ක් පවත්වා තෝරාගත් පුද්ගල කණ්ඩායමකට පුහුණුව ලබාදීමට වර්ෂය ආරම්භයේ සැලසුම් කර තිබුණ ද එම වැඩමුළු පවත්වා නොතිබුණි.

(iii) උපදේශන වැඩසටහන් 30 ක් වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර පවත්වා තිබුණේ වැඩ සටහන් 03 ක් පමණක් වුවද ප්‍රගති වාර්තාවල එය 06 ක් ලෙස දක්වා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

7

(iv) සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම පූර්ව වැඩසටහන් 04 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද පවත්වා තිබුණේ වැඩසටහන් 01 ක් පමණක් වුවද ප්‍රගති වාර්තාවල වැඩසටහන් 02 ක් ලෙස දක්වා තිබුණි.

(v) මුද්‍රණ කටයුතු සඳහා රු. 1,000,000 ක් වියදම් කර වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සංශෝධිත පනතේ පිටපත් 5,000 ක් මුද්‍රණය කර බෙදාහැරීමට සහ වැඩිහිටි සඟරා 1000 ක් මුද්‍රණයට සැලසුම් කර තිබුණ ද අදාළ කාර්යයන් ඉටු කර නොතිබිණි. එසේම 2011 සහ 2012 වර්ෂවලදීද සැලසුම් කළ පරිදි පනතේ පිටපත් 5000 බැගින් මුද්‍රණයකර බෙදාහැර නොතිබුණි.

(ඊ) **අක්ෂි කාච මිලදී ගැනීම හා බෙදා හැරීම**

---

අක්ෂි කාච 1700 ක් හා ශ්‍රවණ උපකරණ 70 ක් රෝගීන්ට ලබාදීමට සැලසුම් කර තිබු අතර ආධාර ලාභීන්ට කාච 1782 ක් ලබා දුන් බව දක්වා තිබුණ ද තොග පොත අනුව නිකුත් කර තිබුණේ කාච 1420 ක් පමණක් වූයෙන් ප්‍රගති වාර්තාවල 362 ක් වැඩියෙන් දක්වා තිබිණි. එමෙන්ම ශ්‍රවණ උපකරණ ද 70 ක් ලබාදීමට සැලසුම් කර තිබුණ ලබා දී තිබුණේ ශ්‍රවණ උපකරණ 45 ක් පමණි.

(උ) **නඩත්තු මණ්ඩල රැස්වීම්**

---

නඩත්තු මණ්ඩල රැස්වීම් සඳහා රු. 850,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද රු. 765,000 ක් පමණක් වියදම් කර තිබුණි. නඩත්තු මණ්ඩල සඳහා අයදුම්පත් 247 ක් ලැබී තිබුණද විසඳුම් ලබා දී තිබුණේ 149 බැවින් භෞතික ප්‍රගතිය සියයට 60 ක් විය.

(ඌ) **වැඩිහිටි නිවාස අළුත්වැඩියා කටයුතු සඳහා ආධාර ලබා දීම**

---

වැඩිහිටි නිවාස 26 ක අළුත්වැඩියා කටයුතු සඳහා රු.10,000,000 ක මුදලක් වෙන්කර තිබු අතර නිවාස 15 කට ආධාර ලබාදුන් බවට ප්‍රගති වාර්තාවල සඳහන් කර තිබුන ද සත්‍ය වශයෙන්ම ආධාර ලබා දී තිබුනේ වැඩිහිටි නිවාස 12 ක් සඳහා පමණි. එම සත්‍ය වියදම රු.5,486,474 ක් වන අතර ප්‍රගති වාර්තාවල රු.5,787,000 ලෙස දක්වා තිබුණ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 55 ක් විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

8

(එ) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩිහිටි දින උත්සව වියදම් රු.5,000,000 ක් වෙන් කර තිබූ අතර ප්‍රගති වාර්තා අනුව වියදම රු.6,120,600 ක් වූවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව වියදම රු.6,146,894 ක් වූ බැවින් ප්‍රගති වාර්තාවල රු.26,294 ක් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුගත රු. 8,251,000 මුදල හා තථ්‍ය වියදම රු.6,146,894 ක් සැසඳීමේදී රු.2,104,106 ක අධි ඇස්තමේන්තුවක් කර තිබුණි.

(ඒ) 2013 වර්ෂයේ ඉටුකරන ලද ක්‍රියාකාරී සැලසුමේ නොමැති කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් රු.5,000,000 ක් වැඩමුළු සඳහා ප්‍රතිපාදනය කර තිබුණි. එහෙත් එම වැඩමුළු වලට ඇතුලත් නොවන වැඩමුළුවක් වන වැඩිහිටි විෂය පිළිබඳව ඒකාබද්ධ ප්‍රවේශයක් ඇති කිරීම සඳහා වූ වැඩමුළු 09 ක් පළාත් මට්ටමෙන් පවත්වා රු.1,165,187 ක් විධිමත් අනුමැතියකින් තොරව වැයකර තිබුණි.

(ii) වැඩිහිටි කමිටු 987 කට රු.4,935,000 ක ආධාර ලබාදීමට අදාල සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් නොවුණි.

(ඔ) පනතේ කර්තව්‍යන් ක්‍රියාත්මක නොකෙරුණු අවස්ථා

වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් 13 වගන්තිය ප්‍රකාරව කළ යුතු වූ සභාවේ පහත සඳහන් කර්තව්‍යන් මේ වනතෙක් ආරම්භ කර නොතිබිණි.

(i) ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතනවලට වැඩසටහන් නිර්දේශ කිරීම.

9

(ii) වැඩිහිටි තැනැත්තන් කෙරෙහි ළමා හා තරුණ පරපුරෙන් ඉටුවිය යුතු යුතුකම් ඔවුනට මනාව අවබෝධ කර දීමේ අදහසින් පාසල් වල හා වෙනත් සුදුසු ස්ථානවල දේශන සම්මන්ත්‍රණ වැඩමුළු හා වෙනත් වැඩසටහන් සංවිධානය කිරීම.

(iii) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම.

(iv) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනා ගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්ධනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාශ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(v) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් අධ්‍යනයන් හා පර්යේෂණවල සොයා ගැනීම්වලට සුදුසු සියලු ක්‍රියා මාර්ග මගින් නිසි ප්‍රචාරයන් ලබාදීම.

(vi) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නගාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධිකරණය කිරීම.

(vii) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

(viii) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර කිරීම.

(ix) මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාව සහ දක්ෂතා ඇතුළත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

10

**4.2** කාර්ය මණ්ඩලය

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 117 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 109 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 08 ක් විය.

(ආ) මාණ්ඩලික නිලධාරින්ගෙන් සියයට 50 ක පුරප්පාඩු පවතින අතර මාණ්ඩලික නොවන නිලධාරින්ගේ තනතුරුවල පුරප්පාඩු ප්‍රමාණය සියයට 5 ක් පමණ විය.

**4.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන 2013 දෙසැම්බර් 31 දිනට රු.5,871,796 ක් වූ ස්ථාවර තැන්පතුව හා එහි වාර්ෂික පොළී ආදායම රු.652,422 ක් වැඩිහිටි සුභසාධන කටයුතු සඳහා යොදා නොගෙන නිශ්කාර්යව තිබිණි.

(ආ) වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමෙහි පවතින මුදල් පසුගිය වසර තුනක් තුළ අදාළ කාර්යයන් සඳහා උපයෝගී කරගෙන නොතිබුණ අතර 2013 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.429,984 ක් විය.

(ඇ) වැඩිහිටි දීමනා ගෙවීම

--------------------------

වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටි පුද්ගලයින් අතරින් මහජනාධාර හෝ සමෘද්ධි ආධාර ලබන වැඩිහිටි තැනැත්තන් වෙත රු.1,000 ක දීමනාව ගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) 2012 ජූනි මාසයේදී වැඩිහිටි දීමනා ගෙවීම සඳහා දිස්ත්‍රික්ක 19 ක පිහිටි බැංකු වෙත යවන ලද රු.1,550,000 ක් විවිධ හේතුන් මත නොගෙවීම නිසා එම මුදල හා ඊට අදාළ පොළිය සමඟ එකතුව රු.1,569,925 ක් සමාලෝචිත වර්ෂය තුළදී සභාව වෙත නැවත එවා තිබුණි.

(ii) දිවයින පුරා සිටින වැඩිහිටි දීමනා ලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතියක් ආයතනය විසින් 2014 අගෝස්තු 29 විගණන අවස්ථාව වනවිටත් සකස් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය, ගෙවූ ප්‍රතිලාභී සංඛ්‍යාව, නොගෙවූ මුදල් ප්‍රමාණය, සහ ප්‍රතිලාභීන් මියයාම පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් කැඳවා, තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 අවිධිමත් ගණුදෙනු

----------------------

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට අදාළ නොවූ විදේශ සංචාරයන් සඳහා රු. 188,449 ක අත්තිකාරම් මුදලක් සමාජ සේවා අමාත්‍යාංශයට ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

## 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

------------------------

2003 ජූනි මස 02 දිනැති පීඑෆ් 12 චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එම ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 03 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

---------------------

2003 ජූනි 02 දිනැති පීඑෆ් 12 චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 අගෝස්තු 27 දින වන විටත් සභාගත කර නොතිබුණි.

## 5.4 අයවැය පාලනය

------------------

අයවැය ලේඛනයේ ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර සියයට 10 සිට සියයට 66 ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

12

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම් කරණය

(ආ) වාහන පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

සමාජ සේවා අමාත්‍යාංශය
சமூக சேவைகள் அமைச்சு
Ministry of Social Services

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders

76

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
முதியோர்களுக்கான தேசிய சபை
NATIONAL COUNCIL FOR ELDERS

මගේ අංකය / எனது இல / My No. NSE/FC3/GENERAL/QUIRES
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date. 2014.09. 26

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1. දරන මුදල් 14(2)සී වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

උක්ත ද මසුම සම්බන්ධයෙන් ඉදිරිපත් ඔබගේ සමාංක එල්.එස්/ /බී/එන්සීඊ/1/13/09 කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් පහ

02. මූල්‍ය ප්‍රකාශන

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.

i. නව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සම්බන්ධයෙන් මෙම ආයතනයේ නිලධාරීන්ට පළපුරුද්දක් හෝ පූර්ව අත්දැකීම් ලබාගන නොතිබූ බැවින්, ප්‍රමිත අංක 01 හි 21 ඡේදයේ (ඉ) පරිදි අයවැය ගත වියදම් හා සත්‍ය වියදම් වල සන්සන්දනාත්මක වාර්තාවක් ඉදිරිපත් කර නැත. විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව 2014 වර්ෂයේ සිට නිවැරදි වාර්තාවක් අවසන් මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ii. ඉහත පිළිතුර අදාල වන අතර, ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වෙනස් වීම් වාර්තාව විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව 2014 වර්ෂයේ සිට අවසන් මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරමි.

iii. 2013 වර්ෂය සඳහා පුනරාවර්ථන සඳහා රු. මිලියන 76 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 20 ක්ද, අනුමත විය. ඒ අනුව අයවැය ගත මුළු මුදල ඉක්මවා වැය කිරීම් සිදුකර නොමැති අතර, ඒ ඒ වැය විෂයන් සඳහා වැඩිපුර වැයකිරීම්, ඉතිරිවූ වැය විෂයන්ගෙන් ලබාගෙන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අනුමැතිය ලබාගෙන භාණ්ඩාගාරය වෙත ද (අයවැය අධ්‍යක්ෂ ජනරාල්) වාර්තා කර ඇත.

iv. මෙම ආයතනයේ නිලධාරීන්ට පළපුරුද්දක් හෝ පූර්ව අත්දැකීම් ලබාගන නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්වය ප්‍රකාශණය විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව 2014 වර්ෂයේ සිට නිවැරදි ආකෘතිය යටතේ අවසන් මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி ,தொகுதி D, செத்சிரிபாய - கட்டம் II, பத்திரமுல்லை
Address : 2nd Floor , Block D, Sethsiripaya - II Stage, Baththaramulla.
ඊ-මේල් / ஈ-மெயில்/ E-mail : nsemss@sltnet.lk
දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2187045
කාර්යාලය / அலுவலகம் / Office : 3094543
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015

(75)

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). 2012 දෙසැම්බර් 31 ට වෙනත් මෙහෙයුම් වියදම් ලෙස දැක්විය යුතු මුදල 211,713,759.87 ක් වුවද, ප්‍රමාද දෝශයකින් රු. 34,179,097.78 ක් ලෙස සටහන් වී ඇත. මෙම වරද නිවැරදි කර ඉදිරි වසරේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ආ). මෙහි පෙන්වා දී ඇති පරිදි සමාජ සේවා අධ්‍යක්ෂකතුමියට ලබාදුන් අත්තිකාරම් මුදල පියවීමේදී විවිධ ආදායම් ලෙස ගිණුම්ගතකර ඇත. මෙම වරද සකස් 2014 වර්ෂයේ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ). 2012 වසරේ වැඩිහිටි උත්සවය සඳහා ප්‍රාදේශීය ලේකම්, කුරුණෑගල වෙත යවන ලද රු. 10,000/- බැගින් වූ මුදල් මෙම කාර්යාල උත්සවය පවත්වා නොමැති බැවින්, මුදල් ආපසු ලබාගන්නා ලද අතර, නමුත් වැරදීමකින් ලේජරයෙ හි විවිධ ආදායම් යටතේ දෙවරක්ම ගිණුම්ගත වී ඇත මෙවැනි වැරදි ඉදිරියේ දි සිදු නොකිරීමට නිළධාරීන්ට උපදෙස් දුන් අතර මෙම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඈ). පුහුණු හා දැනුවත් කිරීම් සඳහා පවත්වන ලද වැඩසටහන් වලට අදාල ලේජර් ගිණුමෙහි වැරදීමකින් වැරදි ලෙස ගිණුම් ගත වි ඇත.

(ඉ). ඉහත පිළිතුර අදාල වන අතර, පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන් ගිණුම යටතේ පෙන්වා දී ඇති අගයන් ලෙජරයෙහි පිටපත් කිරීමේදී අතපසු වීමකින් වැරදි ලෙස ගිණුම්ගත වි ඇත. මෙවැනි වැරදි ඉදිරියේ දි සිදු නොකිරීමට නිළධාරීන්ට උපදෙස් දුන් අතර මෙම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඊ). මෙම ගිණුම් වැරදි ලෙස ගිණුම්ගත වි ඇති අතර විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව වැරදි ඉදිරියේ දි සිදු නොකිරීමටත් මෙම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.

(උ). ස්ථාවර තැන්පතුව තැන්පත් කර ඇත්තේ වැඩිහිටි සුභ සාධනය සඳහා යොදා ගැනීමටයි. මෙම සුභ සාධන කටයුතු මෙතෙක් ක්‍රියාත්මක කිරීමට පාලක සභාවේ අනුමැතිය ලැබී නොමැති බැවින් ලද පොලි මුදල ආදායමක් ලෙස පෙන්වා නොමැත.

(ඌ). 2013.12.31 දිනට තොග අගය 610,411.26 කි. මගේ උපලේඛණයේ අංක 37 යටතේ A4 Photo copy බණ්ඩල් 93 ක් රු. 565.00 බැගින් 52,600.80 ක් හා අංක 48 යටතේ රෝනියෝ පැකට් 4ක් එකක් රු. 324.80 බැවින් රු. 1299.20 ක් තොග ලේඛනයේ ප්‍රමාද දෝශයකින් සටහන් වී ඇත.

(එ). ලී බඩු උපකරණ ගිණුම නිවැරදි කර 2014 වර්ෂයේ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඒ). 2012 වර්ෂයේ උත්සව අත්තිකාරම් ගිණුමේ ශේෂයේ ගැලපීම 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙන් සිදු කරන ලද අතර, වැරදීමකින් ශුද්ධ වත්කම් ශේෂය නිවැරදි කිරීමට නොහැකි වීම නිසා ශුද්ධ වත්කම් රු.1,000.00 ක් වැඩියෙන් දක්වා ඇත. මෙය ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙන් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඔ). වාහන වල සමුච්චිත ක්ෂය වෙන් කිරීම 2014 වර්ෂයේ අවසන් මුල්‍ය ප්‍රකාශයෙන් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඕ). මෙම කැමරාව ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන්, පළාත් සමාජ සේවා නිලධාරීන්, දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන නිලධාරීන් හට කාර්යාල කටයුතු සඳහා භාවිතයට (හැඳුනුම්පත් ඡායා රූප ලබා ගැනිමට වැනි) යොදා ගන්නා නිසා කාර්යාල උපකරණ ලෙස අර්ථ කථනය කර ඒ යටතේ ගිණුම් ගත කර ඇත.

(ක). 2012 වර්ෂයෙ දි විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව 2013 වර්ෂයේ සිට තැන්පත් ගිණුමක් තැන්පත් ලෙජරය මඟින් පවත්වා ගන යාමට කටයුතු කළ අතර ගිණුම්ගත කිරීමේදි වැරදි ලෙස සටහන් වී ඇති අතර නිවැරදි කර නැවත ඉදිරි වසරේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ග). මෙහි පෙන්වා දී ඇති මුදල බැංකු වාර්ථාවේ 2011 වර්ෂයේ සිට හදුනා නොගත් ලැබීම් දෙකකි. (27,314.31 සහ 2,350.00) මෙම මුදල 2013.12.12 දින රිසිට්පතක් මඟින් (G/22 989558) මුදල් පොතට ලබා ගැනිමට කටයුතු කර තවදුරටත් සොයා බැලිමකින් ආපසු ගෙවීමට ඇති බවට සැක සහිත බැවින් තැන්පත් ගිණුමට ගිණුම් ගත කරද තැන්පත් ලේජරයේ පිටපත් කිරීමට අතපසු වී ඇත. මෙම ලේජරය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව කාරුණිකව ඉල්ලා සිටිමි.

(ජ). මෙම මුදල් වැල්ලවාය, හික්කඩුව, තිහගොඩ ප්‍රදේශිය ලේකම්වරුන් විසින් 2012 වසරේ වැඩිහිටි උත්සවය නොපැවැත් වු විසින් ආපසු එවු මුදලකි. මෙය තැන්පත් ගිණුමට බැර කර ඇති අතර මාරු පත්‍රයක් මඟින් ආදායම් ගිණුමට මාරු කිරීමට 2014 සැප්තැම්බර් මාසයේ කටයුතු කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.

(ට). වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ක්‍රියාත්මක කරනුයේ ප්‍රභූවරුන්ගෙන් ලැබෙන ආධාර මුදල්වලිනි. මේවා එම පුද්ගලයින් විසින් ඍජුවම බැංකුවට බැර කරන ලදී. රු. 24000/- ක මෙම මුදල ශාන්ති හින්ටඩ් මැතිනිය විසින් ලබාදුන් බව හඳුනාගෙන ලැබුවේ බැංකු වාර්තාව ලැබීමෙන් අනතුරුවයි. එබැවින් 2014 ජනවාරි 09 වන දින කැපකරු මුදල් පොතට ඇතුලත් කර ඇත. වර්ෂය තුළදී හඳුනා ගැනීමට නොහැකි වූ බැවින් ගිණුම් ගත කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි.

(ඩ). ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2012 වර්ෂයේදී අත්කම් ප්‍රදර්ශනයක් සඳහා ලද මුදලින් ඉතිරියකි. මෙම මුදල ආධාර මුදලක් බැවින් ආපසු ගෙවීමක් සිදුකර නොමැති අතර, ඉදිරියේදී රජයේ ආදායම් ගිණුමට ලබා ගැනීමට හෝ පාලක මණ්ඩල තීරණයක් පිරිදි සුදුස්සක් කිරීමට අපේක්ෂා කරමි.

(න). මෙම ලෙජර් ගිණුම ප්‍රමාද දෝශයකින් නිවැරදිව නඩත්තු කර නොමැති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

2\. 2. 3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් ලී බඩු උපකරණ | 12,745,749 | ස්ථාවර වත්කම් ලේඛනය මෑත කාලයේදී පිළියෙල කිරීමට කටයුතු කළ අතර විෂය නිලධාරීන්ටද මේ සඳහා අත්දැකීම් නොමැති බැවින් හා ස්ථාවර වත්කම් ලේඛනය ඉතාමත් සංකීර්ණ බැවින් නිවැරදි ලෙස ලේඛන ගත කර සම්පූර්ණ කොට නොමැති බව පිළිගනිමි. ඉදිරියේදී නිලධාරීන්ට නිසි පුහුණුවක් ලබා දී මෙම ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු යොදන බව කාරුණිකව දැනුම් දෙමි. |
| යන්ත්‍ර උපකරණ | 3,969,075 | |
| (ආ) ත්‍රිවිල් රථය | 250,000 | මීට අදාල ලිපිගොනුව අස්ථාන ගතවී ඇත. තවදුරටත් ලේඛනාගාරය සොයා බැලීමට කටයුතු කර ඇත.නමුත් ආරක්ෂිත සේප්පුවේ ඇති ලියා පදිංචි සහතිකයෙන් ඡායා පිටපතක් ලබාගෙන නව ලිපි ගොනුවක් ආරම්භ කර ඇත. මෙම ත්‍රිවිල් රථය මේ වන විට මන්නාරම නගරයේ සාන්තෝම් වැඩිහිටි නිවාසයට ලබා දී ඇත. |
| (ඇ) අත්තිකාරම් | 1,000 | රු. 1000.00 අත්තිකාරම් මුදල 2011 වසරින් ඉදිරියට ගෙන එන ලද නොපියවූ අත්තිකාරම් බැවින් 2013 අත්තිකාරම් ලේඛනයේ සඳහන් නොවේ. එම මුදල 2013 වසරේදී පියවීමට කටයුතු කරන ලදී. |
| (ඈ) දිවා මධ්‍යස්ථාන වලට උපකරණ ලබා දීම | 775,000 | මෙම දිවා මධ්‍යස්ථාන වලට උපකරණ ලබා ගත් බවට බිල්පත් ප්‍රාදේශීය ලේකම් මගින් මේ වන විට සනාථ කිරීමට තොරතුරු එවා ඇත. තහවුරුවක් එවා නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට සිහි කැඳවීම් ලිපි යවමින් පසු විපරම් ක්‍රියාවලියක් සිදු කරමින් පවතී. |
| (ඉ) වැඩිහිටි දින උත්සවය සඳහා නිල ඇඳුම් ලබා දීම | 57,925 | 2013 වසරේ නිල ඇඳුම් ලබා දීමට අනුමත වූ ලිපිය මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම - 01) |
| (ඊ) ග්‍රාමීය වැඩිහිටි කමිටු බැංකු ශේෂ | | මේ වන විට එම සනාථ කිරීම් සමඟ බැංකු ශේෂයන් පිළිබඳ තොරතුරු ලැබෙමින් පවතී. මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 156 න් කමිටු 748 ක් සඳහා මුදල් තැන්පත් කළ බවට තහවුරු කිරීම් ලැබී ඇත. වරින් වර මේ සඳහා සිහිකැඳවීම් යවා ඉදිරියේදී එම තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (උ) වැඩිහිටි හැඳුනුම්පත් සඳහා ඡායාරූපය | 15,748 | ප්‍රමාද දෝශයකින් විෂය නිලධාරි මඟින් තොරතුරු ඉදිරිපත් කිරීමේදි ද්විගණනය වී සටහන් වී ඇත. එවැනි අඩුපාඩු මින් ඉදිරියට නොවීමට කටයුතු කරමි. |
| (ඌ) වැඩිහිටි කමිටු | 4,935,000 | වැඩිහිටි කමිටු සඳහා ඉල්ලීම් බලාපොරොත්තු වු ප්‍රමාණයට වඩා ලැබී තිබුණ අතර එවිට සිටි අධ්‍යක්ෂ හා වැඩිහිටි තැනැත්තන් සඳහා වු ජාතික සභාවේ අනුමැතිය මත ගෙවීම් සිදු කරන ලදි. |

**2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

අනුකූල නොවීම් නිරීක්ෂණයන්ට පහත තොරතුරු ඉදිරිපත් කරමි.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | [illegible]නාවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරණ මුදල් පනත | |
| i. (1) 8 වගන්තිය | වර්ෂයේ අනුමත අයවැය ප්‍රතිපාදනය භාණ්ඩාගාර විසින් වෙන් කිරීමෙන් පසුව අවශ්‍ය පරිදි වැය විෂයන් සඳහා වෙන් කිරීම් මේ දක්වා එසේ අනුමැතියක් ලබාගෙන නොමැත. ඉදිරියේදී විගණනය පෙන්වන පරිදි එසේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| ii. (3) 14 වගන්තිය | 2012 වර්ෂයේ වාර්ෂික වාර්ථාව 2014.09.04 දින ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) මුදල් රෙගුලාසි<br>i.මු. රෙ. 110 | මු. රෙ. 102 යටතේ හානි පාඩු වාර්ථා කිරීමට වෙන වෙනම පොත් දෙකක් පවත්වා ගැනීමට විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව කටයුතු කර ඇත. ඒ අනුව NB - 2688 දරන වෑන් රථය 2013.07.18 දින සිදු වු හදිසි අනතුර සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කොට යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| ii.මු. රෙ. 845 - (1) | (i)මෙම ආයතනයේ දුරකථන (කාර්යාලිය හා නිවාස) පිළිබඳ ලේඛනයක තොරතුරු ඇතුලත් කර යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.<br>( ii ) මාසික දුරකථන ගාස්තු ගෙවීමේ ලේඛනයක් විගණනය පෙන්වා දීමෙන් අනතුරුව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |
| iii. මු. රෙ. 565 - (4) | තැන්පතු ලේඛණය යාවත්කාලින කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| vi. මු. රෙ. 562 - (2) | අතපසුවීමකින් මෙය සටහන් කර නොමැති වුවද තැන්පතු නිවැරදිව ගිණුම් ගත කර ඇත. ඒ අනුව ලේජරය |

| | |
|---|---|
| | යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| v. මු. රෙ. 565 - (5) | පොදු 71 ආකෘතිය භාවිතා කරමින් විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව ඉදිරියේදී එම තොරතුරු ඉදිරිපත් කිරීමට සටහන් කරගත් බව කාරුණිකව දන්වා සිටිමි. |
| vi. මු. රෙ. 1645 (ආ) සහ (ඇ) | විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව අදාල ලොග් පොත් ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වාගෙන යාමට විෂය නිලධාරියාට උපදෙස් ලබා දී ඇත. |
| vii. මු. රෙ. 756 හා 757 | ලබන වසරේ සිට වාහන පිළිබඳ වාර්ෂිකව සමීක්ෂණය පවත්වා වාර්ථා ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| viii. මු. රෙ. 104 (3) සහ 104(4) | NB - 2688 දරන වෑන් රථයේ අනතුර සම්බන්ධ අදාල වාර්ථාවේ පිටපතක් ප්‍රමාද දෝෂයකින් ඔබ වෙත ඉදිරිපත් කර නොමැත. නමුත් මේ සම්බන්ධ වාර්ථාව අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්ථාවේ පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.(ඇමුණුම - 02) |
| ix. මු. රෙ. 1646 | විගණනය පෙන්වා දීමෙන් අනතුරුව සැප්තැම්බර් මාසයේ සිට අදාල වාර්ථා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට විෂය භාර නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත. |
| i. 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 ඡේදය | මාණ්ඩලික නිලධාරියාට මේ අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. මේ අනුව කටයුතු කිරීම මෙම ආයතනයේ දැනට එක් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් බැවින් ප්‍රයෝගිකව සිදු කිරීම අපහසු වී ඇත. එබැවින් පරිපාලන නිලධාරිනියගේ අධීක්ෂණය යටතේ දැනට කටයුතු කරනු ලැබේ. ඉදිරීයේදී මෙම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකු යටතේ සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| ii. 2.11 ඡේදය | ඉදිරියේදී මේ අනුව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| iii. 2002 පෙබරවාරි 22 දිනැති අංක 01/2002 , 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 (1) | විගණනයේ පෙන්වා දීමෙන් අනතුරුව සංචිතුයේ වෑන් රථය සඳහා රාජ්‍ය ආයතනයේ නම සහ රාජ්‍ය ලාංඡනය යොදා ඇත. |
| iv. 1999 පෙබරවාරි 26 දිනැති අංක 2/99 04 හා 05 ඡේද | ඊට අදාල තොරතුරු මගේ අංක NSE/FC3/GENARAL/QUIRES හා 2014.07.18 දිනැති |

| | |
|---|---|
| | ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.(ඇමුණුම - 03) |
| ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ . 2003 ජුනි 30 දිනැති අංක පීඩී/12 8.3.9 ඡේදය | ලේකම්, සමාජ සේවා අමාත්‍යංශයේ නියෝග පරිදි මෙම ආයතනය සතු මෝටර් දෙක අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇත. |

4. මෙහෙයුම් සමාලෝචනය

4. 1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම.

මා විසින් සම්පාදනය කරන ලද වාර්ෂික ප්‍රගති නාම ලේඛන වාර්ථාවේ ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල සඳහා අරමුදල් සම්පාදනයේදී ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 34ක් සඳහා අරමුදල් ලබා දී ඇති බව දක්වා ඇත. නමුත් විගණන විමසුමේ දක්වා ඇත්තේ එහි ප්‍රමාණය 20ක් බවයි. නමුත් මා එම ලේඛනයේ 20ක් ලෙස දක්වා ඇත්තේ වාර්ෂික ඇස්තමේන්තු ගත ප්‍රමාණය 20ක් ලෙසය. නමුත් සත්‍ය වශයෙන් කමිටු 34ක් සඳහා රු. 255,000ක ආධාර ලබා දී ඇති බව සඳහන් කරමි.

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.

(i). ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් වාර්ෂිකව වැඩිහිටි හැඳුනුම්පත් ලබා දීමට අපේක්ෂා කරන ප්‍රමාණය දළ වශයෙන් ප්‍රගති වාර්තා වල සඳහන් කරන නමුත් වැඩිහිටි හැඳුනුම්පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලීම් අනුව ගෙවීම් කිරීම සිදුවේ.

අදාළ 2013 මූල්‍ය කාර්ය්‍ය සාධන ප්‍රකාශනයේ සඳහන් ප්‍රමාණයට වඩා රු. 575.00 ක වෙනසක් ගණනය කිරීමේ වෙනසකින් ප්‍රගති වාර්තා වල සඳහන් වී ඇති නමුත් ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරමි. එසේම අදාළ වර්ෂය තුළ වැඩිහිටි හැඳුනුම්පත් ඡායාරූප 15748 ක් ලබාදී ඇරති නමුත් ගණනයේදී වැඩිපුර ඡායාරූප 2073 ක් වැරදීමකින් සඳහන් වී ඇත. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන බව සඳහන් කරමි.

(ii). වැඩිහිටි හැඳුනුම්පත් ලබාදීමේදී සාමාන්‍යයෙන් දින කිහිපයකින් අදාළ වැඩිහිටි හැඳුනුම්පත් ඡායාරූප ලබාදෙන අවස්ථාවලදී ඡායාරූප ලබාදෙන අවස්ථාවලදී ඡායාරූප දෙකක් සඳහා රු. 25.00 ක මුදලක් අදාළ ඡායාරූප ශිල්පීන් සඳහා ලබාදෙනු ලැබේ. එහෙත් එක් දිනකින් ඡායාරූප ලබාදෙන අවස්ථා වලදී සමහර විට ඡායාරූප දෙකක් සඳහා රු. 30.00 බැගින් ලබා දෙනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතියද ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් යෙදවීම.

අදාල තොරතුරු අසම්පූර්ණ බැවින් සැලසුමට වඩා දිවා මධ්‍යස්ථාන 05කට අඩුවෙන් ප්‍රතිපාදන ලබා දී තිබේ. අඩුපාඩු සම්පූර්ණ කර එවූ පසු එම මධ්‍යස්ථාන සඳහාද භාණ්ඩ මිළදී ගැනීම සඳහා ප්‍රතිපාදන මේ වන විට නිදහස් කර ඇත.

(ඈ) මුද්‍රණ කටයුතු

(i) හා (ii) වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සංශෝධිත පනතේ පිටපත් බලාපොරොත්තු වූ අයුරින් නිකුත් නොවූ හෙයින්ද සහ වැඩිහිටියෝ සඟරාව සඳහා මුද්‍රණ පිරිවැය දැරීමට ශ්‍රී ලංකා හෙල්ප්ඒජ් ආයතනය ඉදිරිපත් වීම තුලින්ද අදාල ඉලක්ක සපුරා ගත් අතර ඒ සඳහා ප්‍රතිපාදන වැය නොවීය.

(iii) වැඩ බලන අධ්‍යක්ෂවරිය පත්වී පැමිණියේ අගෝස්තු මාසයෙන් අනතුරුවය. ඒ වන විට අදාල දෑ කිරීමට සැලැස්මක් නොවූ හෙයින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සංශෝධනයට ලක් නොකෙරිණි. එසේ හෙයින් අදාල සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොවීය.

තවද ක්‍රියාකාරී සැලැස්මක් දක්වා නොතිබිණද සේවයේ අවශ්‍යතාවය ඉතා දැඩිව තිබූ හෙයින් අදාල කම්ටු අත්පොත් පිටපත් 14,000ක් ද පළාත් වැඩිහිටි බල මණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල සඳහා සහතිකපත්‍ර 55ක් ද මුද්‍රණය කළ බව සඳහන් කරමි.

(ඉ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

සැලසුම් කරන ලද ප්‍රමාණ 138 ක් වුවද අප ආයතනයට පාලනය කළ නොහැකි හේතූන් මත පුහුණු වැඩමුළු 4 ක් පමණක් පැවැත්වීමට සිදු විය.

(ඊ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඉටු නොකළ කාර්ය

i. වැඩසටහන් 100 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට සැලසුම් කර තිබුණේ උපදේශන අංශයෙනි. මෙම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අතර අප කාර්යාලයේ කටයුතු සඳහා කාලය වෙන් කර ගැනීම අපහසුතාවය මත එම වැඩසටහන් පැවැත් වීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි.

ii. පාඨමාලා 04 ක් සැලසුම් කර තිබුණද පහත කරුණු මත එම වැඩමුළු ද පැවැත්වීමට අපහසු විය.

- වැඩිහිටි අය සෞඛ්‍ය තත්වයෙන් ඉතා දුර්වල බැවින් ස්ථානගත කර ගැනීමට නොහැකි වීම.
- ප්‍රවාහන පහසුකම් ලබා දීමේ අපහසුව.
- පළාත් මට්ටමින් නිලධාරීන්ට යාමට පරිපාලන වියදම් නොමැති වීම.

iii. උපදේශන වැඩසටහන් 30 ක් වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කළද පවත්වා තිබුණේ වැඩසටහන් 03කි. මේ සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරී මහතා විශ්‍රාම යාම හේතුවෙන් වෙනත් නිලාරියෙකු සොයා ගැනීමට අපහසු වීම. තවද මේ සඳහා ද පළාත් මට්ටමින් නිලධාරීන්ට යාමට පරිපාලන වියදම් නොමැති වීම.

iv. පහත හේතු මත එම වැඩසටහන් මුලු ප්‍රමාණයම පැවැත්වීමට නොහැකි විය.

- සම්පත්දායකයන් සොයා ගැනීමට නොහැකි වීම.
- පරිපාලන වියදම් අවම මට්ටමක පැවැතීම.

ප්‍රගති වාර්තා වල වැඩසටහන් 02 ක් පැවැත්වූ බව සටහන් වූයේ ප්‍රමාද දෝෂයක් නිසා බව කාරුණිකව දන්වා සිටිමි.

v. වැරදීමකින් පාලන වාර්තාවේ මෙසේ සටහන් වූවද පවත්වන ලද නිවැරදි වැඩසටහන් ගණන පහත පරිදි වේ. විශ්‍රාම පූර්ව වැඩසටහන් එකක් සහ උපදේශන වැඩසටහන් 03 ක් පමණි.

vi. මුළු ප්‍රතිපාදන රු. 5,000,000 කි. එහෙත් මේ සඳහා සත්‍ය වශයෙන් වැය කරන ලද්දේ රු. 3,108,601/- ක් පමණි. මෙම ප්‍රතිපාදන වලින් රු. 1,885,000/- වෙනත් වැය විෂයන්ට මාරු කිරීමට කටයුතු කරන ලද අතර, ඒ අනුව 99.8 % ප්‍රතිශතයක් වාර්තා කෙරේ. අත්‍යාවශ්‍ය වැය විෂයන්ට ප්‍රතිපාදන අවශ්‍ය වීම නිසා මෙසේ මාරු කිරීමට හැකි වැය විෂයන්ගෙන් මාරු කළ බව ද වැඩි දුරටත් සඳහන් කෙරේ.

(උ) අක්ෂි කාච මිළදී ගැනීම හා බෙදා හැරීම

අක්ෂිකාච 1700ක් ලබාදීමට අපේක්ෂා කලද මූල්‍යමය ප්‍රතිපාදන නොතිබූ බැවින් එම ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. ප්‍රගති වාර්තාවල තොරතුරු ලබාදීමේදී විෂය මගින් ද්විගණනය වී සංඛ්‍යාව වැඩියෙන් සටහන් වී ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කර ඇත.

(ඌ) කතරගම වැඩිහිටි නිවාසයේ නඩත්තු වියදම්

කතරගම වැඩිහිටි නිවාස නඩත්තු වියදම් යටතේ කතරගම සංචාරක නිකේතනය, කතරගම වැඩිහිටි නිවාසය සහ ඉදිකිරීමට අපේක්ෂිත දැනට මූලික වැඩ කටයුතු සිදු කර අවසන් මාලිගාතැන්න ඉඩම සම්බන්ධ වියදම් ඇතුළත් වේ.

සේවක වැටුප්

පවිත්‍රතා කටයුතු

ජල බිල්පත්

විදුලි බිල්පත්

මාලිගාතැන්න ඉඩමේ මුරකරු සඳහා ගෙවීම් සහ ඉඑම ස්ථානයේ සිදු කරන ලද විවිධ වැඩසටහන්

යන කරුණු සඳහා මේ යටතේ මුදල් වියදම් කර ඇත.

ජල බිල්පත්, විදුලි බිල්පත් සහ මාලිගැතැන්න සිදු කරන ලද විවිධ වැඩසටහන් සඳහා කරන ලද වියදම් නිශ්චිතව තීරණය කළ නොහැකි අවිනිශ්චිත වියදම්ය. එම නිසා වෙන් කර තිබූ රු. 1,000,000/- ක මුදලට වඩා රු. 196,000/- ක මුදලක් වැඩිපුර වියදම් වී ඇත.

(එ) නඩත්තු මණ්ඩල රැස්වීම්

නඩත්තු මණ්ඩල අයදුම්පත් 247 න් විසදුම් 149 ට විසදුම් ලබා දී ඇති අතර ඉතිරි අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතියි.

(ඒ) වැඩිහිටි නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා ආධාර ලබාදීම

වැඩිහිටි නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා නිවාස 15 ට ආධාර ලබාදුන් බවට ප්‍රගති වාර්තා වල සඳහන් වුවද, සත්‍ය වශයෙන්ම නිවාස 12 කට පමණක් ආධාර ලබාදී ඇති බව සටහන් කරමි. මෙවැනි ප්‍රමාදයන් ඉදිරියට සිදු නොවන බව ද කාරුණිකව සඳහන් කරමි.

(ඒ) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය

i. 2013.09.12 දින පැවති වැඩිහිටි තැනැත්තන්ගේ ජාතික සභාව මගින් අනුමැතිය ලබාදී ඇත. (ඇමුණුම - 04)

ii. ප්‍රමාද දෝශයකින් සිදුවී ඇත. ජාත්‍යන්තර වැඩිහිටි දිනය සඳහා දරන ලද සත්‍ය වියදම රු. 6,146,893.60 කි. අතපසුවීමකින් ප්‍රගති වාර්තාවේ 6,120,600 ක් ලෙස දක්වා ඇත. මෙවැනි අඩුපාඩු ඉදිරියට සිදු නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

iii. පහත සඳහන් සේවා කාර්යයන් සඳහා ඇස්තමේන්තුවල අගයට අඩුවෙන් වැය වී ඇත. භාහිර සම්පත්දායකයන් මගින් මුදල් සොයා ගෙන වැඩිහිටි උත්සවය පැවැත්වීම සඳහා ඇස්තමේන්තු සකස් කළද, එසේ මුදල් සොයා ගැනීමට නොහැකි විය. ඒ අනුව, ඇස්තමේන්තු ගත මුදල හා දරන ලද සත්‍ය වියදම අතර, වෙනසක් ඇති විය.

(ඕ) 2013 වර්ෂයේ ඉටුකරන ලද ක්‍රියාකාරී සැලසුමේ නොමැති කාර්යයන්

ඇස්තමේන්තු කළ පහත සඳහන් වැඩසටහන් මුළු ප්‍රමාණයෙන් එපරිදිම ක්‍රියා කිරීමට නොහැකි වූයේ ආයතනයේ අධ්‍යක්ෂක ධූරය පුරප්පාඩු වීම හා ඒ සඳහා වැඩ බලන නිලධාරියෙකක් පත්වීම නිසා පූර්ණකාලීනව යෙදීමට අපහසු වීම හේතුවෙනි. එහෙත්, අතපසු වීමකින් මේ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුනි. එබැවින්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කිරීමට නිලධාරීන් දැනුවත් කර කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.

(ක) පනතේ කර්තව්‍යන් ක්‍රියාත්මක නොකෙරුණු අවස්ථා

පනතේ ආ සිට ග ඡේදය සඳහන් ඉහත කාර්යයන් සිදුකළ නොහැකි වීමට පහත කරුණු ප්‍රධාන වශයෙන් බලපාන ලදී. වර්ෂයේ මාස ගණනාවක්ම ස්ථිර නිලධාරියෙකු අධ්‍යක්ෂක ධූරයේ නොසිටීම, අධ්‍යක්ෂක ධූරය සඳහා වර්ෂය තුළ වරින් වර නිලධාරීන් තිදෙනෙකු මාරුවීම. එබැවින්, මෙම වර්ෂයේ සිට පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව පනතේ ආ සිට ග ඡේදය දක්වා වැඩිහිටි සුභසාධනය හා ආරක්ෂණය පිළිබඳව කටයුතු කිරීම සඳහා වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් වෙත වැඩසටහන් සකස් කිරීමට සහ සැලසුම් සකස් කිරීමට රාජකාරි පවරා ඇත. ඒ අනුව ඉදිරියේදී පනතේ ප්‍රකාරව කටයුතු කෙරෙනු ඇත.

4.2 කාර්ය මණ්ඩලය

මාණ්ඩලික නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය තුල බඳවා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය වෙතද දන්වා ඇත. මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර ඇත.

4. 3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මේ සම්බන්ධයෙන් වන නිර්දේශ ජාතික සභාව වෙත ඉදිරිපත් කර ඇත. සභාවේ නිර්දේශයන් ලැබුනු පසු ඒ සම්බන්ධ කටයුතු සිදුකරනු ලැබේ.

(ආ) මෙම වැඩසටහන පවත්වාගෙන යන්නේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන ආධාර වලිනි. ගිණුමේ පවත්නා මුදලින් ප්‍රතිලාභීන් සඳහා ගෙවීම් කිරීම යම්තාක් දුරකට සිදු කලත් එය දිගින් දිගටම සිදු කළ නොහැකිය. ගිණුම පවත්වාගෙන යාමට යම් මුදලක් ගිණුමෙහි තැම්පත් වී තිබිය යුතුය. පරිත්‍යාගශීලීන් විසින් මුදල් නොගෙවන අවස්ථා වලදී ගිණුමේ මුදල් භාවිත කර අදාල ප්‍රතිලාභීන් සඳහා නොකඩවා මුදල් ලබාදීම් සිදුකරනු ලැබේ. එබැවින්, මෙම ගිණුමේ සැලකිය යුතු ශේෂයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ.

(ඒ) වැඩිහිටි දීමනා ගෙවීම

(i), (ii) හා (iii)

වැඩිහිටි දීමනා ලාභීන්ගේ තොරතුරු පද්ධතියක් සකස් කිරීමට සැලසුම් කර ඇත. මේ වන විට මාසිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලැබෙන ප්‍රතිලාභීන්ගෙ තොරතුරු පරිගණක ගත කරන අතර නිරන්තරයෙන් එය යාවත්කාලීන කළ යුතුව ඇත. ඒ සඳහා තොරතුරු ලබා ගැනීම වැනි කරුණු මෙයට බාධාවකි. එබැවින් මෙම කටයුත්ත තරමක් සංකීර්ණ වුවද ඉදිරියේදී වැඩිහිටි දීමනා ලාභීන්ගේ තොරතුරු පද්ධතියක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව ඉතා කාරුණිකව සඳහන් කරමි.

4.4 අවිධිමත් ගණුදෙනු

සමාජ සේවා අධ්‍යක්ෂතුමිය වෙත අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරන ලද හා ජනාධිපති කාර්යාලයෙන් විදේශ නිවාඩු අනුමත කරන ලද විදේශ ගමන් දෙකක් සඳහා මුදල් ගෙවීමට සමාජ සේවා දෙපාර්තමේන්තුව අපොහොසත් වූ බැවින් එවකට අධ්‍යක්ෂ ධූරයේ රාජකාරී ආවරණය කරන ලද බැවින් මෙම ගෙවීම් කිරීම සඳහා මෙම ආයතනයට යොමු කොට ඇත. මෙම මුදල ගෙවීමට නොහැකි බව ගණකාධිකාරී විසින් දැන්වූ පසුව පියවා ගැනීමේ තහවුරුවක් ලබා ගෙන අත්තිකාරම් ලෙස නිකුත් කර ඇත. ඒ අනුව සමාජ සේවා අමාත්‍යාංශය මගින් පියවීමටද කටයුතු කළ බව දන්වා සිටිමි.

5. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

5.1 <u>ගිණුම් ඉදිරිපත් කිරීම.</u>

ස්ථිර ගණකාධිකාරීවරයෙක් නොමැති වීම, නව ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමට සිදුවීම, පලපුරුදු නිලධාරීන් නොසිටීම යන හේතූන් නිසා මෙම ගිණුම් නියමිත කාලයට ඉදිරිපත් කර ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී මෙම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

5.3 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම.</u>

ඉදිරි පාලක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වමි.

5.4 <u>අභ්‍යන්තර විගණනය</u>

අභ්‍යන්තර විගණනය විසින් එවන ලද විගණන විමසුම් සඳහා අදාල තොරතුරු ඉදිරිපත් කර ඇත.

5.5 <u>අයවැය පාලනය</u>

පුරප්පාඩු පැවතීම, ඉහළ කළමණාකරන තනතුරු සඳහා රාජකාරි ආවැ ), ප්‍රමාණවත් ප්‍රාග්ධන වියදම් සඳහා අත් මුදල් නොලැබීම යන කරුණු මේ සඳහා හේතු විය.

06. <u>පද්ධති හා පාලනය</u>

(අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ)

ඉහත කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු කර කටයුතු කරන බව එම පාලන ක්‍රම ශක්තිමත් කර ඉතා නිවැරදිව හා යාවත්කාලීනව සකස් කිරීමට නිලධාරීන් දැනුවත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය